# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.01 පැය 0810 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out /616/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>**

**01. කේරළ ගංජා ප්‍රවාහනය කළ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2025.03.31 වන දින රාත්‍රී කාලයේ මාලඹේ පොලිස් වසමේ කහන්තොට ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීමක් සිදු කර **කේරළ ගංජා කිලෝ 02 ක් කාර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මාලඹේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 39 වන කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාලඹේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. බලපත්‍ර නොමැතිව කපන ලද දැව කඳන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුර.**

2025.03.31 වන දින උදෑසන කාලයේ මාමඩුව පොලිස් වසමේ කල්ලිකුලම් රක්ෂිතයේදී පොලිස් විශේෂ කාර්ය බලකා පුලියන්කුලම කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වව්නියාව අඩවි වන කාර්යාලයේ නිලධාරින් සමඟ වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව කපන ලද පලු දැව කඳන් 05 ක් ලොරි රථයකින් ප්‍රවාහනය කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වව්නියාව අඩවි වන කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන මාමඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වව්නියාව අඩවි වන කාර්යාලය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**